# බෞද්ධ ජාතක කථා වස්තු විෂය කර ගත් මධ්‍යතන යුගයේ ගී කාව්‍යත්‍රයෙන් නිරූපිත ලලිත කලා

අයි. ආර්. නදීකා සඳමාලි පීරිස්[1]

මධ්‍යතන යුගයේ ගී කාව්‍ය ග්‍රන්ථ ත්‍රිත්ත්වය මුවදෙව්දාවත, සසදාවත සහ කව්සිළුමිණ නම් වෙයි. මෙම කාව්‍යත්‍රය බෞද්ධ ජාතක කථා විෂය කර ගත් පද්‍යමය කථා කාව්‍ය වේ. බෞද්ධ ජාතක කථා වස්තු කර ගත් නමුත් මේ අවධියට අයත් කවීහු සංස්කෘත කාව්‍ය අනුගමනය කළහ. එහි දී සාහිත්‍යයට අමතරව ලලිත කලා නිරූපණයට වැඩි නැඹුරුවක් දක්වා ඇත. ලලිත කලා **(Fine Arts)** කලාවේ ප්‍රභේද අතරින් එකකි. සංගීතය, චිත්‍ර, මූර්ති, ගෘහ නිර්මාණ ශිල්පය, නර්තනය ආදී කලාංග එයට ඇතුළත් වෙයි. මෙම පර්යේෂණයේ අධ්‍යයන ක්ෂේත්‍ර ලෙස මධ්‍යතන යුගයේ ගී කාව්‍ය සහ ලලිත කලා අදාළ වෙයි.

මෙම පර්යේෂණ පත්‍රිකාවේ අරමුණ වනුයේ බෞද්ධ ජාතක කථා තේමා කර ගත් මධ්‍යතන යුගයේ ගී කාව්‍යත්‍රයෙන් නිරූපිත ලලිත කලා පිළිබඳ විමර්ශනය කිරීම යි. මධ්‍යතන යුගයේ ගී කාව්‍යත්‍රයෙන් නිරූපිත ලලිත කලා නිරූපණයට හේතු මොනවා ද? ඓතිහාසික හෝ සමාජ පසුබිම හේතු වූයේ ද? කිසියම් කාව්‍යාභාසයක් ඊට හේතු වූයේ ද? මධ්‍යතන යුගයේ කාව්‍යත්‍රයෙන් නිරූපිත ලලිත කලා මොනවා ද? යනාදී පර්යේෂණ ගැටලු මෙහි දී අධ්‍යයනය කිරීමට අභිමත ය. මෙම පර්යේෂණයේ දත්ත විශ්ලේෂණය පුස්තකාල පරිශීලනය සහ අන්තර්ජාලය මගින් ප්‍රාථමික සහ ද්විතියික දත්ත රැස් කර ගැනීම සිදු වෙයි. එම දත්ත ප්‍රාථමික සහ ද්විතියික දත්ත තුලනාත්මක නිරීක්ෂණය මගින් තර්කානුකූල නිගමනයන්ට එළඹීම සහ විස්තරාත්මක ව විවරණය කිරීම සිදු වෙයි.

'බෞද්ධ ජාතක කථා වස්තු විෂය කර ගත් මධ්‍යතන යුගයේ ගී කාව්‍යත්‍රයෙන් නිරූපිත ලලිත කලා' යන මෙම අධ්‍යයනය පිළිබඳ පුළුල් පර්යේෂණයක් සිදු ව නොතිබීම නිසා සාහිත්‍ය ක්ෂේත්‍රයට ඉමහත් දායකත්වයක් වනු ඇත. එමෙන් ම තම සාහිත්‍ය විචාර දැනුම ද වර්ධනය කර ගත හැකිය.

**ප්‍රමුඛ පද-** බෞද්ධ ජාතක කථා, මධ්‍යතන යුගයේ ගී කාව්‍ය, ලලිත කලා,

1 සහාය කථිකාචාර්ය, සිංහල අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය
nadeeka.pieris@yahoo.com